# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 13
NUMBER 09

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

DECEMBER 10, 2010 දෙසැම්බර් මාසය (බුද්ධ වර්ෂ 2554 උඳුවප් මාසය) http://www.lankaheritage.com/lankaviththi/


## පාඨක ඔබ සැමට සුබ නත්තලක් වේවා!



විඳ දුක් නොහිම් තරමින් දිව රෑ නිතර
වෙනසක් නොපා කිසි තම දරුවන් අතර
නිවනක් සදන උන්හට සෙනෙහෙන් පතර
තව එක් කෙනෙක් නැත ලොව අම්මා විතර

**Enduring enormous hardship all her life to raise children**
**And treating everyone of them in equal measure**
**Her affection is a protection that guides them further**
**Can one see another, anywhere, resembling the Mother !**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

# කියුම් සහ කෙරුම්!

♦ කීර්ති ජයසුන්දර

පසුගිය අප නොවැම්බර් කලාපයෙන් පසු ගතවූ සති කීපය තුළ අප රටේ වැදගත් සිදුවීම් කීපයක් දකිනු හැකිවීය. ඓතිහාසික, සාමාජික, ආර්ථික හා දේශපාලනික වශයෙන් වැදගත්කමක් උසුලන මේ කාරණා මෙහි මාධ්‍යය මගින්ද නිතර ප්‍රකාශ කෙරුණු බැවින් පාඨක ඔබට යළිත් ඒ ගැන විස්තර වශයෙන් කීම අනවශ්‍යය. අද මේ ලිපියේ මුඛ්‍ය අරමුණ වනුයේ එම වැදගත් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමුකරවීමයි. ඒසේම එම සිදුවීම් සැබැවින්ම අප රටේ අනාගතයට බලපාන බැවින් දැන් සිටම ඒ දෙස විමර්ශනාත්මකව බැලීම වැදගත්ය.

### මාගම්පුර නව වරාය

නොවැම්බර් මස දෙවන සතියේ දී පමණ හම්බන්තොට ඉදිකළ මාගම්පුර නව වරාය තුළට මුහුදේ සිට කනින ලද ඇල පද්ධතියක් මගින් ජලය ගෙනවුත් පුරවන ලදී. කොළඹ හා ගාල්ලෙහි සහ රටවටා ඇති වෙනත් වරායයන් මෙන් නොව මෙම හම්බන්තොට වරාය මුහුදට සමීප ගොඩබිම හාරා තනන ලද කෘතිම එකක් වන අතර, මුහුදේ සිට කපන ලද විශාල ඇලක් මගින් ඒ තුළට ජලය ගලා ඒමට සලස්වා තිබේ. මෙම ඇලම මහා සමුද්‍රයේ සිට වරාය අභ්‍යන්තරයට නැව් ගෙන ඒමට ද, එමගින්ම නැව් පිටත්කර හැරීම සඳහා ද යොදාගැණේ. මෙවැනි වරායයන් ලොව තව ඇත්තේ ඉතාමත් සුළු ප්‍රමාණයක් බැවින් මේ හම්බන්තොට වරාය ඉදිකිරීමේ ඓතිහාසික වටිනාකම තවත් වැඩිවන්නේය. මෙම ව්‍යාපෘතිය තනිකරම ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ සිහිනයක් සැබෑ වීමකි. එතුමන් මේ සඳහා නොසෑහෙන මහන්සියක් ගත් බව අපි දනිමු. එසේම එදින ජනාධිපතිවරයාගේ සහභාගිත්වයෙන් වූ විවෘතකරන උත්සවය අවස්ථාවේ හාපුරා කියා විශාල නැව් දෙකක් ඇත මුහුදේ සිට විත් මෙම නව වරාය තුළට සේන්දුවීම සැබැවින්ම අසිරිමත් දර්ශණයක් වූයේ ය.

### දිවුරුම්දීම

ඉහතකී අවස්ථාව ගතවූ වහාම ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ සිය දෙවන ජනපති වාරය සඳහා දිවුරුම් දීම සිදුවීය. එහිදී ජනාධිපතිවරයා කළ ආරම්භක කතාව ඉතා පැහැදිලි එකක් වීය. එහි අඩංගු වූයේ ඊළඟ වසර හය තුළ තමන් කරන්නට බලාපොරොත්තු වන කාර්‍යයන් පිළිබඳවය. රටේ ඉදිරියට වන සංවර්ධන කටයුතු වලින් කාටත් එක සමානව ඉතා උසස් ප්‍රථිඵල දෙන බවට ඒ කරුණු ඉහළ බලාපොරොත්තු ජනතාව තුළ ඇතිකරන්නට හේතු වූ බව කිව හැකිය.

### නව ඇමති මණ්ඩලයක්

ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන් නව කැබිනට් ඇමති මණ්ඩලයක් ද නියෝජ්‍ය අමාත්‍යවරුන්ද පත්කරගත් අතර මේ පිරිස ජනාධිපතිවරයා සිය දිවුරුම්දීමේ කතාවේ දී ප්‍රකාශ කළ අනාගත උසස් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි ලා ඔහුට සහාය වන පිරිස වශයෙන් සිටිති.

### නව අය වැය වාර්තාවක්

අවසාන වශයෙන් ඉහතින් දැක්වූ සිදුවීම් වලට දින කීපයකට පසු මුදල් අමාත්‍යවරයාද වන ජනාධිපතිවරයා ඉදිරි 2011 වර්ෂය සඳහා අයවැය වාර්තාව ද ඉදිරිපත් කළේය. මෙම අය වැයෙහි හොඳ නරක වග විභාග කිරීම ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ තවමත් සිදුවෙමින් පවතී.

එක පිට එක සිදුවුණු ඉහතකී කටයුතු නිසා ජනාධිපතිවරයා ද ඔහුගේ ඇමති මණ්ඩලය ඇතුළු කාර්‍ය සාධක පිරිසටද හුස්ම ගන්නට පවා අවස්ථාවක් නොතිබුණා විය හැකිය. ඒ හා සමානව පුවත්පත් මාධ්‍යද ටෙලිවිෂන් චැනල්ද කාර්ය බහුල වී ඇත.

ඔවුන්ගේ අවධානය සුපුරුදු පරිදි යොමුව ඇත්තේ නව ඇමති මණ්ඩලය සහ අළුත් අයවැය වාර්තාව පිළිබඳ හොඳ නරක ජනතාවට පෙන්වාදීමටය.

රටේ වර්තමානයේ සහ ඇත අනාගතයේ සිදුවීමට නියමිත කාර්‍යයන් පිළිබඳ න්‍යාය පත්‍රයක් වශයෙන් අයවැය සැලකිය යුතුවේ. එම න්‍යාය පත්‍රයේ අඩංගු කාර්‍යයන් ක්‍රියාත්මක කරන්නටද, ඒ පරමාර්ථ සාක්ෂාත් කරන්නට, සැබෑවක් කරන්නට බැඳී සිටින පිරිස ඇමති මණ්ඩලයයි. ඒ න්‍යාය පත්‍රයෙන් බලාපොරොත්තුවන දේවල් ඉටු වනු ඇත්තේ ඔවුන්ගේ අධිෂ්ඨානය, ඉමහත් කැපවීම, පළපුරුද්ද, හැකියාව, කාර්යශූරත්වය, උපායශීලීබව ආදී මේ සියල්ල මතය. ඒ ගුණාංග මේ සඳහා විශාල වශයෙන් අවශ්‍ය වන්නේය.

**2009-2010** අයවැය යුද්ධය අවසන් වීමත් සමග ඉදිරිපත් කළ නිසා එය ඒ වසරට මුදල් යොදවීම පිළිබඳ ක්ෂණික වාර්තාවක් පමණක් විය. එහෙත් මේ **2011** සඳහා යෝජිත අයවැය වාර්තාව වඩාත් වැදගත් එකක් වශයෙන්

4 වන පිටුව බලන්න →




අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට
සාමය සතුට පිරී, අසිරිමත් නත්තලක් සහ
සුබ නව වසරක් වේවා!

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3